# කතුවැකිය

**තුසිත මලලසේකර**

**සකල විද්‍යාවන්හී - අග්‍ර රාජණිය**

පාසැල නිමා වී ගෙදර පැමිණි පොඩිපුතු තම පාසැල් බෑගය මේසය මතට විසිකළ ආකාරයත්, ඔහුගේ මුහුණේ පෙනුමත් දුටු පියා සැක සිතුවේ තම පුතු හට යම් අකරතැබ්බයක් සිදුව ඇති බවය.

"ඇයි පුතා අද ඉස්කෝලෙදි ළමයෙක් ඔයාට ගැහැව්වද?"

"නෑ නෑ තාත්තෙ මට අපේ ටීචර්ව තේරුම්ගන්න බැහැ. මම නම් ආයිමත් ඉස්කෝලෙ යන්නෙ නැහැ"

"ඇයි මොකද? ටීචර් ඔයාට බැන්නද"

"නැහැ, නැහැ, අපේ ටීචර් ගාව එක වචනයක් නැහැ. ඊයේ කිව්වා හයයි දෙකයි අටයි කියලා. අද කියනවා පහයි තුනයි අටයි කියලා. මට නම් මහ විකාරයි."

පිය පුතු අතර සංවාදය ඉදිරියට ඇදුනේ කෙසේද යන්න ගැන කිව නොහැකි වුවත් පාසල් යන බොහෝ දරුවන් ගණිතය දකින්නේ අසීරු විෂයයක් ලෙසය. එහෙත් අධ්‍යාපනයේදී 'ගණිතය' සමත් වීම අතිශයින්ම වැදගත් වන්නේ අනෙක් විෂයයන් සියල්ලම සමත්වී ගණිතය අසමත් වුවහොත් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය සමත් වූ බව පිළිනොගන්නා තරමට එය වැදගත් විෂයයක් වන හෙයිනි.

කතා කිරීමට සමත්වූ විගසම කුඩා ළමයෙකු තම ඇඟිලි භාවිතා කරමින් ගණන් කරන ආකාරය දැකිය හැකිය. දෙමව්පියන් හට තම ළමයාගේ මෙම දක්ෂතාවය ඔහුගේ හෝ ඇයගේ හෝ වර්ධනයේ ඉමහත් ජයග්‍රහණයකි. එහෙත් පාසලට ගිය අලුතම ගුරුවරයාගෙන් ලැබෙන එක් මුල් අවවාදයක් වනුයේ ගණන් කිරීමට ඇඟිලි භාවිතා කිරීමෙන් වළකින ලෙසය. දෙමව්පියන්ට ජයග්‍රහණයක් වුවත් ගුරුවරුන්ට ඇඟිලි ගැනීම ප්‍රාථමික නොදියුණු කාර්යයකි. ගණිතඥයින්ගේ අදහස නම් මේ දෙපිරිසම, දෙමව්පියන් හා ගුරුවරු, නිවැරදි බවය.

කෙසේවෙතත් ඇඟිලි හෝ වෙනත් යමක් යොදාගනිමින් ගණන් කිරීම මානවයාගේ ඉතිහාසයේ දැවැන්ත බුද්ධිමය ජයග්‍රහණයක් ලෙස සැලකෙයි. එනමුත් වසර සිය දහස් ගණනකට පෙර මිනිසා ලද ජයග්‍රහණයක් වීම නිසාම එම හැකියාව 'ප්‍රාථමික' ලෙස සැලකීම වරදක් නොවේ.

මෙවර විදුරාව සඟරාව සංඛ්‍යා හෝ ගණන් කිරීම හෝ පිළිබඳව පමණක් නොව සමස්ත වශයෙන් 'ගණිතය' තේමාකරගෙන සකස් කරනුයේ වර්තමාන සමාජයීය අවශ්‍යතා සපුරාලීම සඳහා ගණිතය සතු හැකියාව පාදක කරගෙනය.

කතුවැකියෙහි තේමා පාඨය ලෙස "සකල විද්‍යාවන්හී අග්‍ර රාජණිය" ලෙස ගණිතය සඳහන් කරනු ලැබූයේ සියලු විෂයයන් හැදෑරීමේදී මෙන්ම ජීවන වෘත්තීන් හැමකටම පාහේ ගණිතය සම්බන්ධ වන නිසාමය.

සමහර දෙනෙකු විශේෂයෙන්ම පාසැල් ශිෂ්‍යයන් අසීරු විෂයයන් ගොන්නට ගණිතය ඇතුළත් කළද ගණිතඥයින් සහ ගණිත ගුරුවරුන් නම් ගණිතය සලකනුයේ, ඉතාමත් ආශ්වාදජනක සහ විනෝදාස්වාදය ලබාදෙන එදිනෙදා ජීවිතයට මහත් ප්‍රයෝජනයක් ප්‍රායෝගිකව හිමිකරන සුන්දර විෂයයක් ලෙසය. ගණිතය හදාරන පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ට ගණිත රසය භුක්තිවිඳීමට අවස්ථාව සලසාදෙමින් රුසියන් ජාතික වයි.පෙරෙල්මාන්ගේ 'ගණිත විනෝදය' කෘතියෙන් උපුටාගත් කොටස් කිහිපයක්ද මෙවර විදුරාව සඟරාවට ඇතුළත් කිරීමට පියවර ගනු ලැබිණ.